# ලිංගික හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රතිපත්තිය යටතේ පනවනු ලැබූ රෙගුලාසි

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයය

මෙම රෙගුලාසි 1985 අංක 7 දරණ විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත මගින් සංශෝධනය කෙරුණු 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 135 (1) (h) වන වගන්තිය, 29, 35 (6), 45, 46, සහ 135 (3) වගන්ති සමග අනුබද්ධව කියවා පේරාදෙණිය විශ්වවිද්‍යාලයයේ පාලක සභාව විසින් අනුමත කරන ලදී.

1. මාතෘකාව සහ විෂයපථය

මෙම අතුරු ව්‍යවස්ථාව "ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රතිපත්තිය මගින් තහනම් කරනුලැබූ චර්යාවන් සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම පරිපාලනය කරන පරිපාටීය රෙගුලාසි" යනුවෙන් හැඳින්විය හැකි ය.

මෙම අතුරු ව්‍යවස්ථාව ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ නොනිමි මූලික සහ විධිමත් විමර්ශන සම්බන්ධයෙන් යෝග්‍ය වෙනස්කම් සහිතව බලපැවැත්වේ.

**2.** ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය විමර්ශනය සඳහා වන කමිටුව **(CMSGBHSV)**

2.1.සංයුතිය:

2.1.1 මෙම අතුරු ව්‍යවස්ථාවසම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා "ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය විමර්ශනය සඳහා වන කමිටුව (CMSGBHSV)" නමැති මණ්ඩලයක් ස්ථාපිත කරනු ලැබේ. (මෙහි මින්මතු CMSGBHSV ලෙස හෝ 'කමිටුව' ලෙස හැඳින්වේ.)

2.1.2 මෙම කමිටුව විශ්වවිද්‍යාල පාලක සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයින් පහළොස් දෙනෙකු (15) ගෙන් සමන්විත වේ. එම පත්කිරීම් සිදුකිරීමේ දී විශ්වවිද්‍යාල පාලක සභාව විසින් පහත දැක්වෙන නියෝජනයන් තහවුරු කරනු ලැබේ:

(අ) පාලක සභාවේ සාමාජිකත්වය දරණ පුද්ගලයන් දෙදෙනෙක් (02),

(ආ) විශ්වවිද්‍යාල අධ්‍යයන ප්‍රජාවෙන් තෝරාගනු ලබන ස්ථිර සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන්/සාමාජිකයින් දසදෙනෙක් (10),

(ඇ) විශ්වවිද්‍යාලයයේ අධ්‍යයන හෝ පරිපාලන ක්ෂේත්‍රයේ සේවය කොට විශ්‍රාම ලබා සිටින, විශ්වවිද්‍යාලයයට පරිබාහිර පුද්ගලයින් තිදෙනෙක් (03).

2.1.3 මෙම පත්කිරීම් සිදුකිරීමේදී, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාවක් දක්වා ඇති, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ කරුණු කෙරෙහි සමානාත්මතාවය සහ සමසාධාරණත්වය පාදක කොටගත් දෘෂ්ටියකින් කටයුතු කිරීමේ උනන්දුවක් පෙන්වා ඇති, සහ ලිංගික හිංසනය සහ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ගැටලුවිමර්ශනය සම්බන්ධයෙන් පුහුණුවක් ලබා ඇති පුද්ගලයින් ඒ සඳහා හැකි සෑම අවස්ථාවකදී ම පත්කිරීමට විශ්වවිද්‍යාල පාලක සභාවේ සාමාජිකයින් විසින් වගබලාගනු ලැබේ.

2.1.4 මෙම අතුරු ව්‍යවස්ථාවේ අංක 2.2 යටතේ දක්වා ඇති කුමන හෝ හේතුවක් මත ඇතිවන සාමාජිකත්ව පුරප්පාඩුවීමක දී හැරුණු විට, අනු ඡේද අංක 2 යටතේ පත්කෙරෙන සෑම සාමාජිකයෙක්/සාමාජිකාවක් ම වසර තුනක (03) කාලසීමාවක් සඳහා එම තනතුර උසුලයි.

2.1.5 අනු ඡේද අංක 2 යටතේ පත්කෙරෙන සාමාජිකයෙක්/සාමාජිකාවක් තවත් එක් වසර තුනක (03) ධූරකාලයක් සඳහා පමණක් යළි තෝරාපත්කරගනු ලැබීමට සුදුසුකම් ලබයි.

2.1.6 සිය පළමු රැස්වීමේදී, කමිටුව විසින් තම සාමාජිකත්වය අතුරින් අයෙකු සභාපතිධූරය සඳහා පත්කරගනු ලබයි. සභාපතිධූරය පිළිබඳව එකඟත්වයක් හෝ අභිරුචියක් නොමැති අවස්ථාවක දී, එම ධූරයේ කටයුතු කරන මෙන් උපකුලපති විසින් කමිටුවේ වඩාත් ම ජ්‍යෙෂ්ඨ සාමාජිකයා/සාමාජිකාව වෙතින් ඉල්ලාසිටිනු ලබයි.

2.1.7 විශ්වවිද්‍යාලයයේ නීති හා ලේඛන අංශයේ නීති කටයුතු පිළිබඳ නිලධාරියා හෝ නිලධාරිනිය සහකාර ලේඛකාධිකාරී/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ නියෝජ්‍ය ලේඛකාධිකාරී කමිටුවේ ලේකම් වශයෙන් කටයුතු කරයි.

**2.2.** පත්කිරීම සඳහා නුසුදුසු වීම සහ තනතුර පුරප්පාඩු වීමඃ

2.2.1 පහත සඳහන් අවස්ථාවකදී සාමාජිකයෙකු/සාමාජිකාවක ගේ තනතුර පුරප්පාඩු වේඃ

(අ) එවැනි සාමාජිකයෙකු/සාමාජිකාවක මියයාමේදී

(ආ) එවැනි සාමාජිකයෙකු/සාමාජිකාවක උපකුලපති වෙත ලිඛිතව දන්වා අදාළ තනතුරින් ඉල්ලා අස්වීමකදී

(ඇ) එවැනි සාමාජිකයෙකු/සාමාජිකාවක මෙහි 2.2(2) හි දක්වා ඇති හේතුවක් මත අදාළ තනතුර දැරීම සඳහා නුසුදුසුබවට පත්වූ අවස්ථාවකදී

(ඈ) එවැනි සාමාජිකයෙකු/සාමාජිකාවක විසින් කමිටුවේ සභාපතිවෙත පැහැදිලිකිරීමක් නොදක්වා කමිටුවේ අනුක්‍රමික රැස්වීම් තුනකට (3) සහභාගී නොවීඇති අවස්ථාවකදී

(ඉ) එවැනි සාමාජිකයෙකු/සාමාජිකාවක ගේ ධූරකාලයඉකුත්වීමකදී

2.2.2 පහත සඳහන් අවස්ථාවකදී සාමාජිකයෙකු/සාමාජිකාවක කමිටුවේ සේවය කිරීම සඳහා නුසුදුස්සෙකු බවට පත්වේ:

(අ) එවැනි සාමාජිකයෙකුට/සාමාජිකාවකට එරෙහිව මෙම ප්‍රතිපත්තිය යටතේ තහනම්කොට ඇති චර්යාවක් පිළිබඳ නොනිමි පැමිණිල්ලක් පවතින අවස්ථාවකදී හෝ

(ආ) එවැනි සාමාජිකයෙකු/සාමාජිකාවක මෙම ප්‍රතිපත්තිය යටතේ තහනම්කොට ඇති චර්යාවක් සම්බන්ධයෙන් වැරදිකරුවකු බවට ඔප්පු වූ අවස්ථාවකදී හෝ

(ඇ) එවැනි සාමාජිකයෙකු/සාමාජිකාවක හට **CMSGBHSV** හි සාමාජිකයෙකු/සාමාජිකාවක වශයෙන් කටයුතු කිරීමේ දී බාධා ඇතිවන ආකාරයේ අප්‍රකාශිත බැඳියාවන් සම්බන්ධ ගැටුම් පවතිනඅවස්ථාවකදී හෝ

(ඈ) එවැනි සාමාජිකයෙකු/සාමාජිකාවක අදාළ තනතුරේ කටයුතු කරගෙන යෑම සඳහා උචිත ශාරීරික සහ මානසික තත්ත්වයක නොසිටින අවස්ථාවකදී හෝ

(ඉ) එවැනි සාමාජිකයෙකු/සාමාජිකාවක අනුචිත මානසික මට්ටමක පසුවන බවට නිසි අධිකරණ බලයක් සහිත අධිකරණයකින් ප්‍රකාශ කෙරුණු අවස්ථාවකදී හෝ

(ඊ) එවැනි සාමාජිකයෙකු/සාමාජිකාවක විසින් කමිටු පටිපාටියේ රහස්‍යභාවය කඩකරනුලැබූ අවස්ථාවකදී

2.2.3 සභාපති හෝ සාමාජිකයෙකු/සාමාජිකාවක හට උපකුලපති වෙත සිදුකෙරෙන ලිඛිත දැනුම්දීමක් මගින් සිය තනතුරින් ඉල්ලා අස්විය හැකිවන අතර, එම ඉල්ලා අස්වීම උපකුලපති විසින් ලිඛිත ව පිළිගත් දින සිට බලාත්මක වේ.

2.2.4 ධූරය පුරප්පාඩු වූ අවස්ථාවකදී, විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනු ඡේද 2.1.2 යටතේ දක්වා ඇති පටිපාටිය අනුගමනය කරමින්, අදාළ සාමාජිකයාගේ/සාමාජිකාවගේ ඉකුත් නොවූ ධූරකාලය සඳහා වෙනත් පුද්ගලයෙකු පත්කරනු ලැබේ.

**2.3.**කමිටු රැස්වීම්

2.3.1 කමිටුව වසරකට අවම වශයෙන් පස්වතාවක් (05) හෝ පවත්නා අවශ්‍යතාවය පරිදි රැස්විය යුතු අතර අනුයාත රැස්වීම් දෙකක් අතර කාලපරාසය දින 60 නොඉක්මවිය යුතු ය.

2.3.2 කමිටුවේ සභාපති සියලු කමිටු රැස්වීම්වල මූලාසනය හොබවන අතර සභාපති නොමැති අවස්ථාවක දී යම් රැස්වීමක් පවත්වන්නේ නම් රැස්ව සිටින සාමාජිකයින්/සාමාජිකාවන් විසින් ඔවුන් අතුරින් තෝරාපත්කරගනු ලබන සාමාජිකයෙකු/සාමාජිකාවක විසින් එම රැස්වීමේ මූලිකත්වය හොබවනු ලබයි.

2.3.3 සියලු සභාවාරයන්හි සටහන් වාර්තාගත කොට, ස්ථිර කොට, සභාසම්මත කළ යුතු ය.

2.3.4 කමිටු රැස්වීමක ගණපූරණය සඳහා අවම වශයෙන් සමස්ථ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක සහභාගීත්වයක් පැවතිය යුතු ය.

**2.4.** කමිටුව සතු බලතල, වගකීම්, සහ කර්තව්‍ය

2.4.1 මෙම ප්‍රතිපත්තිය යටතේ තහනම්කොට ඇති චර්යාවන් පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට උපකුලපතිට සහ පාලක සභාවට සහාය දැක්වීම.

2.4.2 මෙම ප්‍රතිපත්තිය යටතේ සහවිශ්වවිද්‍යාල අතුරු ව්‍යවස්ථාවන් යටතේ පවතින පැමිණිලි සඳහා සහන සපයන කටයුත්තට දායක වීම.

2.4.3 විශ්වවිද්‍යාලය තුළඇතිවන මෙම ප්‍රතිපත්තිය යටතේ තහනම්කොට ඇති චර්යාවන් සම්බන්ධ සිදුවීම්පිළිබඳව සිදුකෙරෙන සමථකරණ කටයුතු සඳහා සහාය දැක්වීම.

2.4.4 විශ්වවිද්‍යාලයයේ අනුග්‍රහය ලබන සියලුම පුද්ගලයින් සහ සියලුම ස්ථාන සම්බන්ධව සිදුවන ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය වළකාලීම සඳහා වන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපකුලපතිට සහ පාලක සභාවට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම.

2.4.5 මෙම ප්‍රතිපත්තිය, වැළැක්වීමේ යාන්ත්‍රණය, සහ පැමිණිලි කිරීම් සම්බන්ධ පටිපාටියවිශ්වවිද්‍යාලයයේ නේවාසික ශාලා, අධ්‍යයන පීඨ, පරිපාලන ගොඩනැගිලි, ආයතන, සෞඛ්‍ය මධ්‍යස්ථානය, පුස්තකාලය, ක්‍රීඩාගාරය, ආපනශාලා වැනි සියලුම ස්ථානවලපැහැදිළිව සහ පුළුල්ව ප්‍රදර්ශනය කිරීම.

2.4.6 ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පාදක කොටගත් වෙනස්කොට සැලකීම්, ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය, සහ ලිංගික

ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණ සිදුකිරීමට සහ ඒ සම්බන්ධයෙන් දැනුවත්කිරීම් සිදුකිරීම සඳහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සම්බන්ධ සමානතාවය සහ සමසාධාරණත්වය (GEE)පිළිබඳ ඒකකයක් පිහිටුවීම සඳහා විශ්වවිද්‍යාලයයට සහාය වීම.

2.4.7 GEE ඒකකයේ වැඩකටයුතු අධීක්ෂණය කිරීම සහ ලිංගික හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වින්දිතයන්ට උපකාර කිරීමෙහිලා (නෛතික, උපදේශනාත්මක, සහ වෛද්‍ය සහාය ඇතුළත්ව) අවශ්‍ය අවස්ථාවන්හි එම ඒකකයට සහාය වීම.

2.4.8 විශ්වවිද්‍යාලයය තුළ පැනනගින ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පාදක කොටගත් වෙනස්කොට සැලකීම්,ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය,සහ ලිංගික ප්‍රචණ්ඩත්වය හා බැඳි ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අරමුණින් යුත් ප්‍රමාණවත් නියෝජනයකින් හෙබි ස්වෙච්ඡා ක්‍රියාකාරීන් කණ්ඩායමක් සෑම සමාසිකයක් ආරම්භයේදී ම පලකරනු ලබන දැන්වීමක් මාර්ගයෙන් පිහිටුවාගැනීම සඳහා GEE ඒකකය සමග කටයුතු කිරීම.

2.4.9 සිය සාමාජිකයන් සහ අදාළ ස්වෙච්ඡා ක්‍රියාකාරීන් සම්බන්ධ කරගතහැකික්‍රම සහ විධි පිළිබඳව පුලුල් ප්‍රචාරයක් ලබාදීම.

**3.**පැමිණිලි පටිපාටිය

**3.1.**පැමිණිලි

3.1.1 මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛන I හි සඳහන් ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රතිපත්තිය මගින් තහනම් කොට ඇති කුමන හෝ චර්යාවක් පිළිබඳව පැමිණිලි කිරීමට අවශ්‍ය ඕනෑම අයෙකුට

(අ) උපකුලපතිට සහ/හෝ

(ආ) CMSGBHSV සභාපතිට සහ/හෝ

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ මාර්ගගත(online) පැමිණිලි පද්ධතිය හරහා

සිය පැමිණිල්ල ඉදිරිපත් කළ හැකි ය. උපකුලපති විසින් එවැනි පැමිණිල්ලක් ලද විට අප්‍රමාදව එම පැමිණිල්ල CMSGBHSV සභාපති වෙත යොමුකරනු ලබයි.

3.1.2 මෙම ප්‍රතිපත්තිය සහ අතුරු ව්‍යවස්ථාව මගින් පාලනය වන ඕනෑම අයෙකු අතින් අදාළප්‍රතිපත්තිය හෝ අතුරු ව්‍යවස්ථාව මගින් තහනම් කොට ඇති

කුමන හෝ කටයුත්තක් සිදුවනු ලබන්නේ නම් ඒ බව මෙම ප්‍රතිපත්තිය සහ අතුරු ව්‍යවස්ථාව මගින් පාලනය වන ඕනෑම අයෙකුට CMSGBHSV වෙත වාර්තා කිරීමේ හිමිකම පවතී.

3.1.3 පැමිණිලි වාචිකව හෝ ලිඛිතව ඉදිරිපත් කළ හැකි අතර, මූලික පැමිණිලි නිර්නාමිකව ද ඉදිරිපත් කළ හැකි ය. යම් පැමිණිල්ලක් වාචිකව ඉදිරිපත් කෙරෙන අවස්ථාවකදී එම පැමිණිල්ල ලිඛිතව සටහන් කරගෙන ඊට පැමිණිලිකරුගේ/පැමිණිලිකාරියගේ අත්සන ලබාගැනීම පැමිණිල්ල භාරගන්නා බලධාරියාගේ වගකීම වේ.

3.1.4 මූලික පැමිණිල්ල නිර්නාමිකව යොමුකෙරුණු අවස්ථාවක දී CMSGBHSV විසින් අප්‍රමාදවපැමිණිල්ල මගින් නම් කොට ඇති පුද්ගලයින්ට අගතියක් නොවන ආකාරයට පැමිණිල්ලේ සත්‍යාසත්‍යභාවය තහවුරු කරගනු ලබන අතර විමර්ශනයක් සිදුකිරීම සඳහා තුඩුදෙන කාරණාවක් ඇති බවට හැඟී ගිය විටක මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා විමර්ශන කමිටුවක් පත්කර ගැනීමේ අරමුණ ඇතිව ඒ සම්බන්ධයෙන් උපකුලපති දැනුවත් කරනු ලබයි.

3.1.5 පවතින තත්ත්වය සලකා බලා අවශයයැයි හැඟීයන්නේ නම් පැමිණිල්ල භාරගනු ලබන පුද්ගලයා විසින් පැමිණිලිකරු/කාරිය වෛද්‍ය, නෛතික, උපදේශනාත්මක හෝ වෙනත් පහසුකම් වෙත යොමු කරනු ලැබේ. එවැනි යොමුකිරීම් කිසිදු අවස්ථාවක පැමිණිලිකරුට/කාරියට පවත්නා නීතිය යටතේ සහනයක් ලබාගැනීමට පවතින හැකියාව බැහැර නොකරයි.

**3.2.** මූලිකතොරතුරු ගවේශනය

මෙම අතුරු ව්‍යවස්ථාවෙහි වෙනස් ආකාරයක් දක්වා නොමැති නම්, පැමිණිලිකරු/කාරිය/කරුවන්/කාරියන් කවුරුන්දැයි දැන හෝ නොදැන උපකුලපති විසින් මූලික තොරතුරු ගවේශනයක් සිදුකරනු ලබයි.

3.2.1 මූලික තොරතුරු ගවේශනය රහස්‍ය ගවේශනයක් වන්නේ ය. මෙම අතුරු ව්‍යවස්ථාව මූලික තොරතුරු ගවේශනය පැවැත්වීම හා සම්බන්ධ කටයුතු සඳහා අදාළ නොවන අවස්ථාවන් වලදී ඒ සම්බන්ධව විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXII වන පරිච්ඡේදයේ 8:1:1 කොටසේ ප්‍රතිපාදන යෝග්‍ය වෙනස්කම් සහිතව බලපැවැත්වේ.

3.2.2 පාලක සභාවේ අනුදැනුම යටතේ උපකුලපති විසින් මූලික තොරතුරු ගවේශන කමිටුවක් (PIC) පත්කරනු ලැබේ. මූලික තොරතුරු ගවේශනය සඳහා පුද්ගලයින් පත්කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXII වන පරිච්ඡේදයේ 6 වන කොටස යෝග්‍ය වෙනස්කම් සහිතව බලපැවැත්වේ.

3.2.3 එම කමිටුව සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ 2.1.2 කොටසේ (අ) සහ (ආ) කාණ්ඩ යටතේ පත්කරනු ලබන CMSGBHSV හි සාමාජිකත්වය අතුරෙන් අවම වශයෙන් එක් සාමාජිකයෙක්/සාමාජිකාවක් පත්කරනු ලැබේ.

3.2.4 PIC ප්‍රමාණවත් ස්ත්‍රී-පුරුෂ සමබරතාවයකින් සමන්විත වන අතර පැමිණිල්ලට පාර්ශවකරුවන් වන පුද්ගලයින්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිරූපනය කරයි.

3.2.5 නීති සහ ලෝබනගතකිරීම සම්බන්ධ අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයා/වරිය විසින් මූලික තොරතුරු ගවේශනය සඳහා යොදාගත් දිනය ලිඛිතව පැමිණිලිකරු/කාරිය/කරුවන්/කාරියන් වෙත දැනුම්දෙනු ලබන අතර විධිමත් විමර්ශනයක් සඳහා ඇති අවශ්‍යතාවය ස්ථාපිත කිරීම පිණිස බැලූබැල්මට පෙනෙන සාක්ෂි ඉදිරිපත් කරන ලෙස පැමිණිලිකරු/කාරිය/කරුවන්/කාරියන් වෙත දන්වා සිටිනු ලබයි.

3.2.6 පැමිණිල්ල වැඩිදුර විමර්ශනය කිරීම සඳහා ප්‍රමාණවත් තරම් බැලූබැල්මට පෙනෙන සාක්ෂි ඇති බවට PIC වෙත පෙනීගියහොත් එම කමිටුව විසින් ඒ බව උපකුලපති සහ පාලක සභාව වෙත ලිඛිතව දන්වා සිටිනු ලැබේ.

3.2.7 පැමිණිල්ල වැඩිදුර විමර්ශනය කිරීම සඳහා ප්‍රමාණවත් තරම් බැලූබැල්මට පෙනෙන සාක්ෂි ඇති බවට PIC වෙත පෙනීගිය අවස්ථාවන්හි දී සමථකරණය මගින් සහ/හෝ විධිමත් විමර්ශනයක් මගින් සහනයක් ලබාගැනීමේ අවකාශය පැමිණිලිකරු/කාරිය/කරුවන්/කාරියන් වෙත ලබාදෙනු ලැබේ. කෙසේ වෙතත්, 3.4.1 යටතේ සඳහන් තත්ත්වයන් වලදී විධිමත් විමර්ශනයක් පවත්වනු ලැබේ.

## 3.3. සමථකරණය

3.3.1 පැමිණිල්ලට අදාළ කාරණාව නිමකිරීම සඳහා සහ/හෝ එය යළි යළිත් ඇතිවීම වැළැක්වීම සඳහා පැමිණිලිකරු/කාරිය හට සමථකරණය වෙත යොමුවීමේ අවස්ථාව පවතී.

3.3.2 සමථකරණය වෙත යොමුවීමේ අපේක්ෂාව ඇති පැමිණිලිකරුවෙකු/කාරියක ඒ සම්බන්ධ ඉල්ලීමක් උපකුලපති වෙත ලිඛිතව දැනුම්දියයුතුය.

3.3.3 එවන් ඉල්ලීමක් ලැබීමෙන් පසු ඉල්ලීම ලැබුණු විට හැකි ඉක්මනින් වගඋත්තරකරුට/කාරියට විරුද්ධව ඇති චෝදනා, පැමිණිලිකරු/කාරිය විසින් සමථකරණය වඩාත් කැමති ප්‍රතිකර්ම යාන්ත්‍රණය වශයෙන් තෝරාගනුලැබූ බව, සහ වගඋත්තරකරු විසින් තෝරාගැනෙන සමථකරුවන්/කාරියන්පිළිබඳ විස්තර විශ්වවිද්‍යාලයයට දැනුම්දිය යුතු දිනය සඳහන් ලිඛිත ප්‍රකාශයක් උපකුලපති විසින් වගඋත්තරකරු/කාරිය වෙත යොමු කරනුලබයි. වගඋත්තරකරු/කාරිය විසින් තෝරාගැනෙන සමථකරුවන්/කාරියන් පිළිබඳ විස්තර විශ්වවිද්‍යාලයයට දැනුම්දිය යුතු

දිනය අදාළ ප්‍රකාශය වගඋත්තරකරු/කාරිය වෙත යැවූ දින සිට වැඩකරන දින හතක් (07) නොඉක්මවිය යුතුය. එම ප්‍රකාශයේ ආකෘතිය සහ එම ප්‍රකාශය වගඋත්තරකරු/කාරිය වෙත යොමුකිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXIIවන පරිච්ඡේදයේ 8:2:1 වන උපපරිච්ඡේදය යෝග්‍ය වෙනස්කම් සහිතව බලපවත්වනු ලැබේ.

3.3.4 උක්ත ප්‍රකාශය යොමුකොට වැඩකරන දින දාහතරක් (14) ඇතුළත උපකුලපති විසින් CMSGBHSV හි අනුදැනුම මත සහ අදාළ පැමිණිල්ල සම්බන්ධ සියලුම පාර්ශවයන්ගේ එකඟතාවය යටතේ සමථකරුවන් දෙදෙනෙකු පත්කරනු ලැබේ.

3.3.5 සමථ මණ්ඩලය එක් අභ්‍යන්තර සමථකරුවකු/කාරියක සහ එක් බාහිර සමථකරුවකු/කාරියක ගෙන් සමන්විත වන අතර ඔවුහු අදාළ පැමිණිල්ල සම්බන්ධ පාර්ශවයන්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයන් නිරූපනය කරති.

3.3.6 සමථකරණ ක්‍රියාවලිය සමථකරුවන්/කාරියන් පත්කරනු ලැබීමෙන් අනතුරුව අදාළ පැමිණිල්ල සම්බන්ධ පාර්ශවයන් අන්‍යෝන්‍ය වශයෙන් එකඟවන ස්ථානයක දී සිදුකරනු ලැබේ.

3.3.7 සමථකරුවන්/කාරියන් ඉදිරියේ පෙනීසිටීම සඳහා පහත දැක්වෙන පුද්ගලයින්ට අවසර ලැබේ:

(අ) අදාළපැමිණිල්ල සම්බන්ධ එක් එක් පාර්ශවයන්ගේ අභිලාෂ වෙනුවෙන් පෙනී සිටින නීති ක්ෂේත්‍රයට සම්බන්ධ නොවන නිරීක්ෂකයන්ට; සහ

(ආ) CMSGBHSV නියෝජිතයෙකුට.

3.3.8 සමථකරණ ක්‍රියාවලිය වගකීම් සහගත ලෙස, තර්ජනාත්මක ස්වරූපයක් නොමැති වටපිටාවක සිදුවන බවට CMSGBHSV නියෝජිතයා විසින් වගබලාගනු ලැබේ.

3.3.9 අදාළ පාර්ශවයන් යම් විසඳුමකට එකඟවන අවස්ථාවක දී එම විසඳුම සම්බන්ධ එකඟතාවයන් ලිඛිතව සටහන්කොට ඊට සමථකරුවන්/කාරියන් ගේ සහ අදාළ පාර්ශවයන්ගේ අත්සන් යොදනු ලබයි. එම ලේඛනයේ පිටපතක් සමථකරුවන්/කාරියන් විසින් හැකි ඉක්මනින් උපකුලපති වෙත යොමුකරනු ලබන අතර උපකුලපති විසින් එය විධිමත් ලෙස අනුමත කොට එයින් අදාළ පැමිණිල්ල සම්බන්ධ කාරණාව නිමාවූ බව ප්‍රකාශයට පත්කරනු ලබයි.

3.3.10 අදාළ පාර්ශවයන් යම් විසඳුමකට එකඟ නොවන අවස්ථාවක දී සමථකරණය මගින් පැමිණිල්ල පිළිබඳ කාරණාව විසඳාගත නොහැකි බව දක්වන වාර්තාවක් සමථකරුවන්/කාරියන් විසින් වහාම උපකුලපති වෙත යොමුකරනු ලැබේ.

3.3.11 සමථකරණය භාවිත කිරීම හේතුවෙන් පවතින නීති යටතේ සහනයක් ලබාගැනීමට පැමිණිලිකරුට/කාරියට ඇති අයිතිය බැහැරලීමක් සිදු නොවේ.

**3.4.**විධිමත් පරීක්ෂණය

3.4.1 (අ)අදාළ පාර්ශවයන් සමථකරුවන්/කාරියන් පිළිබඳ එකඟවීමට අපොහොසත් වූ අවස්ථාවක දී හෝ, (ආ)අදාළ පාර්ශවයන් සමථකරණ විභාගයක දී විසඳුමකට එකඟවීමට අපොහොසත් වූ අවස්ථාවක දී හෝ, (ඇ) කුමන හෝ පාර්ශවයක් විසින් අදාළ පැමිණිල්ල විධිමත් විමර්ශනයක් මගින් විනිශ්චය කරවාගැනීමට තීරණය කරනු ලැබූ අවස්ථාවක දී හෝ, (ඈ) උපකුලපති විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ 3.4.23 යටතේ විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කරනුලැබූ අවස්ථාවක දී හෝ විධිමත් පරීක්ෂණයක් ආරම්භ වේ.

3.4.2 මූලික විමර්ශන කමිටුව විසින් පැමිණිලිකරුට/කාරියට විධිමත් පරීක්ෂණයක් වෙත යොමු වීමට අවස්ථාව සලසමින් නිකුත්කරනු ලබන වාර්තාව ලැබුණු පසු උපකුලපති විසින් විශ්වවිද්‍යාල පාලක සභාවේ උපදේශනය මත විමර්ශන කමිටුවක් (CIQ) පත්කරනු ලබයි. විධිමත් පරීක්ෂණය පැවැත්වීම සඳහා පුද්ගලයින් පත්කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXII වන පරිච්ඡේදයේ 6 වන කොටස යෝග්‍ය වෙනස්කම් සහිතව බලපැවැත්වේ.

3.4.3 විශ්වවිද්‍යාලයේ පවත්නා විනය පටිපාටියේ සඳහන් ක්‍රමවේද යටතේ CIQ පත්කරනු ලබන අතර එය ප්‍රමාණවත් ස්ත්‍රී-පුරුෂ සමබරතාවයකින් සහ පැමිණිල්ල සම්බන්ධ පාර්ශවයන්ගේ ස්ත්‍රී-පුරුෂභාව නිරූපණයකින් සමන්විත වෙයි.

3.4.4 මෙම අතුරු ව්‍යවස්ථාවෙහි වෙනස් ආකාරයක් දක්වා නොමැති නම්, උපකුලපති විසින් විධිමත් විමර්ශනයේ ප්‍රථම විභාගය සඳහා දිනයක් නියම කරනු ලබන අතර එම දිනය ලිඛිතව අදාළ පාර්ශවයන් වෙත දැනුම්දෙනු ලබයි.

3.4.5 පැමිණිල්ලේ ස්වභාවය පිළිබඳව වගඋත්තරකරු/කාරිය වෙත ලිඛිතව දැනුම්දෙනු ලැබේ. අදාළ ලිපිය ප්‍රමාණවත් කාලයකට පෙරාතුව වගඋත්තරකරු/කාරිය අතට පත්කිරීමට විශ්වවිද්‍යාලයය වගබලාගනු ලබන අතර ඉල්ලීමක් කළ අවස්ථාවකදී වගඋත්තරකරුට/කාරියට අදාළ සියලු සාක්ෂි පරිශීලනය කිරීමට අවස්ථාව ලබාදීමට ද වගබලාගනු ලැබේ. මෙම ලිපියේ ආකෘතිය සහ එම ප්‍රකාශය වගඋත්තරකරුට/කාරියට යොමුකිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXIIවන පරිච්ඡේදයේ 8:2:1 වන උපපරිච්ඡේදය යෝග්‍ය වෙනස්කම් සහිතව බලපවත්වනු ලැබේ.

3.4.6 විමර්ශනය පිළිබඳ ලිඛිත දැන්වීම ලැබුණු පසු අදාළ පැමිණිල්ල සම්බන්ධ පාර්ශවයන් විසින් සාක්ෂිකරුවන්/කාරියන් පිළිබඳ ලේඛනයක් ඉදිරිපත් කරනු ලබයි.

3.4.7 අදාළ පැමිණිල්ලට සම්බන්ධ පාර්ශවයන්ට කාර්ය මණ්ඩල සාමාජිකයකු/සාමාජිකාවක, පවුලේ සාමාජිකයකු/සාමාජිකාවක, මිතුරෙකු/මිතුරියක, ශිෂ්‍ය සංගමයේ නියෝජිතයෙකු හෝ තමන් විසින් තෝරාගනු ලබන ඕනෑම පුද්ගලයෙකු සමග පැමිණිය හැකි අතර එම පුද්ගලයාගේ නම සහ හඳුනාගැනීමේ විස්තරනීති සහ ලෝබනගතකිරීම සම්බන්ධ අංශයේ සහකාර ලේඛකාධිකාරී/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ නියෝජ්‍ය ලේඛකාධිකාරී හරහා කමිටුව වෙත දැනුම් දියයුතු වන්නේ ය.

3.4.8 එක් පාර්ශවයක් නීතිඥයකු වන්නේ නම් අවශ්‍යයැයි හැඟීයන විටෙක අනෙක් පාර්ශවය වෙනුවෙන් නීතිඥයකුට ඉදිරිපත්වීමට CIQ විසින් අවසර ලබාදෙනු ලැබේ.

3.4.9 සාක්ෂිකරුවන්/කාරියන් කැඳවීමේ අයිතිය සහ අදාළ වෙනත් සාක්ෂි ඉදිරිපත්කිරීමේ අයිතිය සියලු පාර්ශවයන් වෙත හිමි වේ.

3.4.10 පැමිණිල්ලට සම්බන්ධ ඕනෑම පාර්ශවයකින් හරස් ප්‍රශ්න ඇසීම සඳහා CIQ විසින් අවසර දෙනු ලබයි.

3.4.11 හරස් ප්‍රශ්න ඇසීම අදාළ කාරණාවට සෘජුවම අදාළ වන පරිදි පමණක් සිදු කෙරේ.

3.4.12 CIQ විසින් ප්‍රශ්න අනෙක් පාර්ශවය වෙත ඉදිරිපත් කරනු ලබන අතර ප්‍රතිචාරය සටහන්කරගනු ලබයි. අදාළ නොවේ යැයි හැඟීයන ප්‍රශ්න ඇසීම ප්‍රතික්ෂේප කිරීමට CIQ බලය ඇති අතර හරස් ප්‍රශ්න අසන පාර්ශවය විසින් ඉල්ලීමක් කරනු ලබන්නේ නම් CIQ විසින් එසේ ප්‍රශ්න ප්‍රතික්ෂේප කිරීමට බලපෑ හේතු ඉදිරිපත් කරනු ලබයි.

3.4.13 ලියවිල්ලක් ඉදිරිපත් කිරීම සඳහා කැඳවනු ලබන පුද්ගලයෙකු ලියවිල්ල ඉදිරිපත් කළ පමණින් සාක්ෂිකරුවකු/කාරියක බවට පත්නොවන අතර, සාක්ෂිකරුවකු/කාරියක ලෙස කැඳවනතුරු ඇයව/ඔහුව හරස් ප්‍රශ්න ඇසීමට භාජනය කළ නොහැක.

3.4.14 තමන් විසින් ඉදිරිපත්කරනු ලබන සාක්ෂි වල රහස්‍යභාවය ආරක්ෂා කරන ලෙසට සාක්ෂිකරුවන්/කාරියන් වෙතින් ඉල්ලීම් කරනු ලබන අවස්ථාවන්හි දී පැමිණිල්ලට ආදළ පාර්ශවයන්ට අගතියක් නොවන ආකාරයට එම ඉල්ලීම ඉටුකළ හැකි නම් CIQ විසින් එම ඉල්ලීම ඉටු කරනු ලැබේ.

3.4.15 විමර්ශනය දින ගණනාවක් පුරා පැවැත්විය හැකි අතර අවශ්‍ය වන්නේ නම් පැමිණිල්ල සම්බන්ධ පාර්ශවයන් කිහිප වාරයක් ම දිවුරුම් සාක්ෂි දීම සඳහා කැඳවනු ලැබීමට අවකාශ ඇත.

3.4.16 තම දිවුරුම් සාක්ෂියේ සම්පූර්ණ ලිඛිත පිටපතක් සහ පැමිණිල්ල සම්බන්ධ අනෙක් පාර්ශවයේ දිවුරුම් සාක්ෂියේ පිටපතක් ඉල්ලා සිටීමට සියලු පාර්ශවයන්ට අයිතියක් ඇත.

3.4.17 පැමිණිලිකරුගේ/කාරියගේ ලිංගික ඉතිහාසය සහ/හෝ ලිංගික නැඹුරුව පැමිණිල්ල සම්බන්ධයෙන් අදාළ නොවන අතර, එසේ අදාළ වන විශේෂ අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයෙන් CIQ වෙත පූර්ව දැනුම්දීමක් සිදුකළ යුතු වන්නේ ය.

3.4.18 වගඋත්තරකරුගේ/කාරියගේ අතීත ලිංගික ඉතිහාසය පැමිණිල්ලට අදාළ වන අවස්ථාවන්හි දී සඳහන් කරනු ලැබේ.

3.4.19 පැමිණිල්ලට අදාළ යම් පාර්ශවයක් විසින් කල්තැබීමක් ඉල්ලාසිටින අවස්ථාවකදී එම ඉල්ලීම සාධාරණ යැයි CIQ වෙත හැඟීයන්නේ නම් එම ඉල්ලීමට අවසර දෙනු ලැබේ.

3.4.20 වගඋත්තරකරු/කාරිය සාධාරණ හේතුවකින් තොරව CIQ විසින් නියමකරනු ලබන අනුක්‍රමික විමර්ශන වාර තුනක් සඳහා පෙනීසිටීමට අපොහොසත් වුවහොත් ක්‍රියා පටිපාටිය නවතා දමා පැමිණිල්ල සම්බන්ධයෙන් ඒකපාක්ෂික තීන්දුවක් ලබාදීමට CIQ වෙත බලය ඇත.

3.4.21 විධිමත් විමර්ශනයක් පවත්වාගෙන යාම සඳහා තරම් පසුබිමක් නොමැති බවක් CIQ වෙත හැඟී යන අවස්ථාවක දී උපකුලපතිගේ අනුදැනුම යටතේ සහ පැමිණිලිකරුගේ/කාරියගේ එකඟතාවය සහිතව කමිටුව විසින් අදාළ කාරණාව විසඳීම සඳහා සමථකරණය යෝජනා කරනු ලැබේ.

3.4.22 විධිමත් විමර්ශනය අවසන් වූ පසු හැකි ඉක්මනින් CIQ විසින් සිය නිගමන, විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXIIවන පරිච්ඡේදයෙහි දැක්වෙන පරිදි ඉදිරිපත්කෙරෙන විනය ක්‍රියාමාර්ග සඳහා වන නිර්දේශ ද සහිතව උපකුලපති වෙත භාරදෙනු ලැබේ.

3.4.23 මෙම ප්‍රතිපත්තියේ විෂය පථය යටතේ එන සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයයේ විනය සම්බන්ධ ශිෂ්‍ය අනු නීති යටතේ හෝ විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය යටතේ බරපතල විෂමාචාර වශයෙන් ගැනෙන සිදුවීම් සම්බන්ධයෙන් විධිමත් විනය ක්‍රියාපටිපාටියක් ආරම්භ කිරීමෙන් උපකුලපති සහ/හෝ පාලක සභාව වළකාලන කිසිදු ප්‍රතිපාදනයක් මෙම ප්‍රතිපත්තියේ ඇතුළත් නොවේ.

3.4.24 විමර්ශනය පදනම් කොටගෙන ලබාගත් සොයාගැනීම් සහ නිගමන කිසිවක් පවත්නා නීතිය යටතේ සහනයක් ලබාගැනීමට පැමිණිලිකරුට/කාරියට ඇති අවස්ථාව බැහැර නොකරයි.

3.4.25 පැමිණිල්ලේ සඳහන් සිදුවීම අධිකරණයක නීති කටයුත්තක් ලෙස විභාග වියයුතු ගණයේ සිදුවීමක් බව CIQ වෙත හැඟී යන්නේ නම් එම කමිටුව විසින් එවැනි අධිකරණමය ක්‍රියාදාමයක් යෝජනා කරනු ලබන අතර ඒ වෙනුවෙන් අවශ්‍ය සහයෝගය පැමිණිලිකරු/කාරිය වෙත ලබාදෙනු ලැබේ.

3.4.26 විධිමත් විමර්ශනය පැවැත්වීම සම්බන්ධ කටයුතු සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව අදාළ නොවන අවස්ථාවන්හි දී විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXII වන පරිච්ඡේදයේ 9 සහ 11 වන කොටස් යෝග්‍ය වෙනස්කම් සහිතව බලපවත්වනු ලැබේ.

**3.5.** අභියාචනා

3.5.1 (අ) විශ්වවිද්‍යාලය විසින් පැමිණිල්ලක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගනු නොලැබීම නිසා හෝ, (ආ)මූලික තොරතුරු ගවේශනය සිදුකළ ආකාරය නිසා හෝ, (ඇ) විධිමත් විමර්ශනය පැවැත්වූ ආකාරය නිසා හෝඅතෘප්තියට පත් අයෙකුට 3.5.2 යටතේ පත්කොට ඇති අභියාචනා කමිටුව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

3.5.2 අභියාචනය ලැබුණු පසු විශ්වවිද්‍යාලය පාලක සභාව විසින් අභියාචනය සලකාබැලීම සඳහා කමිටුවක් පත්කරනු ලබයි.

3.5.3 සිය නිගමනය සහ අභියාචනය සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ගයේ ස්වභාවය පිළිබඳව නිර්දේශ අභියාචනා කමිටුව විසින් පාලක සභාව වෙත ඉදිරිපත් කරනු ලබයි. අභියාචනා කමිටුවේ තීරණය අවසන් තීරණයයි.

**3.6.** පටිපාටිය ආරක්ෂක රැකවරණ

3.6.1 මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සිදුකෙරෙන සියලු ක්‍රියා පටිපාටීන් අදාළ පැමිණිල්ල සම්බන්ධ පාර්ශවයන් විසින් තෝරාගනු ලබන භාෂාවෙන්/භාෂාවන්ගෙන් සිදුකෙරේ. අවශ්‍ය අවස්ථාවන් වලදී භාෂා පරිවර්තකයෙකුගේ සේවාවන් ලබාදෙනු ලැබේ.

3.6.2 CMSGBHSV, PIC, CIQ, අභියාචනා කමිටුව, උපකුලපති, සහ විශ්වවිද්‍යාල පාලක සභාව ද ඇතුළත්ව නමුත් ඒවාට සීමා නොවූ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ගැනෙන සියලු අධිකාරීන් විසින් සිය තීරණ සඳහා පාදක වන හේතූන් ඉදිරිපත් කරනු ලබයි. හේතූන් ඉදිරිපත් නොකෙරුණු අවස්ථාවක එම තීරණ වල බලපෑමට යටත් පුද්ගලයා/පුද්ගලයින් හට අදාළ හේතූන් කවරේදැයි විමසා ඉල්ලීමක් කිරීමේ හැකියාව ඇත.

3.6.3 ප්‍රතිපත්තිය, මෙම අතුරු ව්‍යවස්ථාව, හෝ පේරාදෙණිය විශ්වවිද්‍යාලයයතුළ ක්‍රියාත්මක වෙනත් ඕනෑම නීතියක පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද එය නොතකා සෑම සාමාජිකයෙකු/සාමාජිකාවක සහ/හෝ නිලධාරියෙකු/නිලධාරිනියක ම විසින් මෙම රෙගුලාසි යටතේ ගැනෙන පැමිණිලි සම්බන්ධ ක්‍රියා පටිපාටීන්හි රහස්‍යභාවය සුරක්ෂිත කරනු ලබන අතර එසේ සුරක්ෂිත කිරීම සඳහා අනුබල දෙනු ලබයි. මේ යටතේ ගැනෙන අදාළ පාර්ශවයන්හි අනන්‍යතාවය, සම්මුඛ පරීක්ෂණ සම්බන්ධ පටිගතකිරීම්, ලිපිගනුදෙනු, ලිපිලේඛන, වාර්තා සහ අනෙකුත් ආදළ දෑ හෙළිදරවු කළ හැක්කේ බලයලත් පුද්ගලයින්ට සහ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනතේ ප්‍රතිපාදන යටතේ පමණි.

3.6.4 මෙහි දැක්වෙන ඇතැම් ප්‍රතිපාදන අනුගමනය නොකෙරුණු තත්ත්වයක් යටතේ වුවද යුක්තිය ඉෂ්ටවීම බාධාවකින් තොරව සිදුවන්නේ නම් මෙම රෙගුලාසි යටතේ ආරම්භ කරන ලද ක්‍රියා පටිපාටීන් හෝ ඊට අදාළ නිගමන, නිර්දේශ, හෝ නියෝග උක්ත ප්‍රතිපාදන අනුගමනය නොකිරීම යන පදනම යටතේ බලරහිත නොවේ.

**3.7.**පැමිණිලි ඉල්ලා අස්කරගැනීම

3.7.1 පැමිණිල්ලක් සිදුකළ පසුව CMSGBHSV හි අනුමැතියෙන් තොරවඑය ඉල්ලා අස්කරගත නොහැකි ය. පැමිණිල්ල ඉල්ලා අස්කරගැනීම සඳහා සාධාරණ පදනමක් ඇති බවට CMSGBHSV සෑහීමකට පත්වන්නේ නම් උපකුලපතිගේ අනුදැනුම ඇතිව පැමිණිල්ල ඉල්ලා අස්කරගැනීමට අවසර දෙනු ලැබේ.

3.7.2 ද්වේෂසහගත, සාවද්‍ය, හෝ පීඩාකාරී පැමිණිල්ලක් ඉදිරිපත් වී ඇති බව CIQ වෙත හැඟීගියහොත් ඒ බව කමිටුව විසින් උපකුලපති වෙත දැනුම්දෙනු ලැබේ. එවන් අවස්ථාවක දී විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපකුලපති විසින් නොපමාව ඒ බව විශ්වවිද්‍යාල පාලක සභාව වෙත දැනුම්දෙනු ලැබේ.

3.7.3 වගඋත්තරකරු/කාරිය/කාරයන්/කාරියන්ගේ අයුතු චර්යාව ඔප්පු කිරීමට පැමිණිලිකරුට/කාරියට නොහැකි වන තත්ත්වයකදී එසේ ඔප්පු කිරීමට නොහැකිවීම යන පදනම යටතේ පමණක් අදාළපැමිණිල්ල අමතර සාක්ෂි නොමැතිසාවද්‍ය පැමිණිල්ලක් ලෙසට අර්ථකථනයවනු නොලැබේ.

**4.**අතුරු ව්‍යවස්ථාව නිහඬ අවස්ථාවන්හිදී

යම් කාරණාවක් හෝ පටිපාටියක් සම්බන්ධයෙන් මෙම රෙගුලාසි නිහඬ අවස්ථාවකදී විශ්වවිද්‍යාල පාලක සභාව විසින් උචිත යැයි තීරණය කරනු ලබන පටිපාටියක් භාවිතා කරනු ලැබේ.

**5.**අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

උපකුලපතිගේ එකඟතාවය සහිතව සහ පේරාදෙණිය විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතියට යටත්ව CMSGBHSV විසින් නිරන්තරව මෙම රෙගුලාසි යාවත්කාලීන සහ/හෝ සංශෝධනය කරනු ලැබේ. එම යාවත්කාලීන කිරීම් සහ/හෝ සංශෝධනයන් ප්‍රතිපත්තියෙහි සහ මෙම අතුරු ව්‍යවස්ථාවෙහි අරමුණු හා නොගැලපීමක් නොපෙන්වයි නම් පාලක සභාව විසින්ඒවා අනුමත කරනු ලබයි. පාලක සභාවේ මතයට අනුව යෝජිත යාවත්කාලීන කිරීම් සහ/හෝ සංශෝධනයන් ප්‍රතිපත්තියෙහි සහ මෙම අතුරු ව්‍යවස්ථාවෙහි අරමුණු හා නොගැලපෙන්නේ නම් පාලක සභාව විසින් එම යෝජිත යාවත්කාලීන කිරීම් සහ/හෝ සංශෝධනයන් සමාලෝචනය කරන මෙන් උපකුලපති හරහා CMSGBHSV වෙතින් ඉල්ලා සිටිනු ලබයි.

**6.**අර්ථනිරූපනය

මෙම රෙගුලාසි තුළ--

අදාළ සන්දර්භය විසින් වෙනත් ආකාරයකට අර්ථගැන්වීමක් නොකරන්නේ නම්ඃ

පුද්ගල නිශ්‍රිත(subjective) මෙන්ම වාස්තවික(objective)දෘෂ්ටියකින් ගත් කල අදාළ චර්යාව යම් පුද්ගලයෙකුහට විශ්වවිද්‍යාලයයේ අධ්‍යයන කටයුතු සහ ඊකියාවන්හි නියුතුවීමට සහ ඒවායින් ප්‍රතිලාභ ලබාගැනීමට සහ/හෝ විශ්වවිද්‍යාලයයේ නේවාසික පහසුකම් භුක්ති විඳීමට බාධා ඇතිකරවන තරමේ දරුණු ගනයේ පවතින්නේ නම් සහ නිරන්තරව සිදුවන්නේ නම් එවිට 'එදිරිවාදී පරිසරයක්' පවතින්නේ යැයි සැලකේ. නිරන්තරව හෝ පුළුල් වශයෙන් සිදුවන සිදුවීම් නිසාවෙන් හෝ හුදෙකලාව සිදුවන සැලකියයුතු ගනයේ දරුණු සිදුවීමක් නිසාවෙන් එදිරිවාදී පරිසරයක් නිර්මාණය විය හැකිය.

'ප්‍රතිපත්තිය' යන්නෙන්ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රතිපත්තිය හැඳින්වෙනු ලැබේ.

'ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය' යන සංකල්පය තුළයම් පුද්ගලයෙකු වෙත කායික, මානසික,හෝ වෙනත් ආකාරයක හිරිහැරයක් හෝ පීඩාවක් ඇතිකරවන ලිංගික වශයෙන් නිශ්චය වූ ඕනෑම ආකාරයක පිළිගනු නොලබන චර්යාවක් (කායික, මානසික, අභිනයාත්මක, දෘෂ්‍ය, හෝ ලිඛිත) 'ලිංගික හිංසනය' ලෙසත්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ඒ සම්බන්ධව පවතින ඒකාකෘතීන්, ලිංගික නැඹුරුතාවන්, ලිංගික අනන්‍යතාව හෝ ප්‍රකාශනයන පදනම් යටතේ සිදුවන ලිංගික ස්වභාවයක් නොදරන, වාචික හෝ වාචික නොවන, දෘෂ්‍ය, කායික හෝ වෙනත් ගනයට ගැනෙන තර්ජන, බලහත්කාරකම්, ප්‍රචණ්ඩත්වය, බියවැද්දීම්, හෝ එදිරිවාදී ක්‍රියාවන් 'ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම්කොටගත් හිංසනය' ලෙසත් හැඳින්වේ.

පහරදීම් සහ ස්ත්‍රී දූෂණය, ලිංගික බැටරි, අතවර කිරීම, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, හෝ එවන් දේ කිරීම සඳහා උත්සාහ කිරීම වැනි කායික ස්වරූපයකින් යුතු ප්‍රචණ්ඩත්වය මෙන්ම ලිංගික ස්වභාවයකින් යුතු චේතනාන්විත කායික හැසිරීම් 'ලිංගික ප්‍රචණ්ඩත්වය' ලෙස හැඳින්වේ.

මෙම ප්‍රතිපත්තිය යටතේ තහනම් කොටඇති චර්යාවක් සම්බන්ධයෙන් පැමිණිලිකිරීම හෝ මෙම ප්‍රතිපත්තිය යටතේ සිදුකෙරෙන විමර්ශන කටයුතු, වාර්තාකිරීම්, ප්‍රතිකාර්මික හෝ විනය ක්‍රියාමාර්ග සඳහා සහභාගීවීම යන පදනම යටතේ යම් පුද්ගලයෙකුට විරුද්ධව සිදුකෙරෙන තර්ජන, බියවැද්දීම්, ප්‍රතිහිංසන, සහ/හෝ රැකියා හෝ අධ්‍යයන කටයුතු සම්බන්ධ අහිතකර ක්‍රියාමාර්ග 'ප්‍රතිහිංසනය'ලෙස හැඳින්වේ.

## 7. විනය ක්‍රියාමාර්ග

යම් පුද්ගලයෙකු මෙම ප්‍රතිපත්තිය යටතේ තහනම් කොටඇති චර්යාවක නියුතුවී ඇති බව සොයාගත් අවස්ථාවකදී පාලක සභාව විසින් එම පුද්ගලයා වෙත විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XXII වන පරිච්ඡේදය යටතේ උචිත යැයි තීරණය කරනු ලබන දඬුවමක් පනවනු ලැබේ.

## උපලේඛනI

ලිංගික හිංසනය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කොටගත් හිංසනය, ලිංගික ප්‍රචණ්ඩත්වය, සහ ප්‍රතිහිංසාව යටතට පහත චර්යාවන් ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ:

(අ) පිළිනොගනු ලබන ලිංගික නැඹුරුතාවයකින් යුතු ප්‍රවේශ සහ ලිඛිතව, දුරකථනය හරහා, විද්‍යුත් තැපැල හරහා හෝ අන්තර්ජාලය, සමාජමාධ්‍ය වැනි මාධ්‍ය පදනම් කොටගත් වෙනත් සන්නිවේදන ක්‍රම හරහා සිදුකෙරෙන අනවශ්‍ය ලිංගික නැඹුරුතාවයක් සහිත වාචික ප්‍රකාශ, වාචික නොවන ප්‍රකාශ, සහ කායික හැසිරීම්, විශේෂයෙන් ඒවා නැවත නැවත සිදුවන විට;

(ආ) අදාළ පාර්ශවයන්ගේ අනුදැනුමකින් සහ එකඟතාවයකින් තොරව අතිශය පෞද්ගලික සහ ලිංගික දර්ශන පටිගත කිරීම, ඡායාරූපගත කිරීම, විකාශය කිරීම, සහ බෙදාහැරීම;

(ඇ) ලිංගික අනුග්‍රහය සඳහා කෙරෙන ඉල්ලීම්;

(ඈ) ඍජු හෝ වක්‍රාකාර ප්‍රතිලාභ, තර්ජන, හෝ ප්‍රතිහිංසාව සමග බැඳුණු ලිංගික අනුග්‍රහය සඳහා කෙරෙන ඉල්ලීම්;

(ඉ) ඇඳුමකින් ආවරණය වුණු හෝ නොවුණු පෞද්ගලික ශරීර කොටසක් ස්පර්ශ කිරීම හෝ අතගෑම;

(ඊ) ස්ත්‍රී දූෂණය, ලිංගික පහරදීම, හෝ අතවර කිරීම හෝ එවැනි දෑ කිරීමට උත්සාහ කිරීම හෝ එසේ කරන බවට තර්ජනය කිරීම;

(උ) පැමිණිලිකරුට/කාරියට චේතාන්විතව හෝ අනවධානයෙන් මානසික හෝ කායික හානියක් සිදුවන ආකාරයට හෝ තමන්ට තදබල කායික හානියක් සිදුවේ යැයි පැමිණිලිකරුට/කාරියට සාධාරණ බියක් දැනවෙන ආකාරයට සිය වර්තමාන හෝ අතීත ස්වාමිපුරුෂයා හෝ භාර්යාව හෝ සහකරුවා/සහකාරිය විසින් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළදී සිදුකරනු ලබන පහරදීම්, තර්ජන, හිංසනය, කායික අපයෝජනයහෝ ප්‍රචණ්ඩත්වය;

(ඌ) ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ඒ සම්බන්ධව පවතින ඒකාකෘතීන්, ලිංගික නැඹුරුතාවන්, ලිංගික අනන්‍යතාව හෝ ප්‍රකාශන යන පදනම් යටතේ සිදුවන ලිංගික ස්වභාවයක් නොදරන, එදිරිවාදී පරිසරයක් නිර්මාණය කිරීමට තුඩුදෙන වාචික හෝ වාචික නොවන, දෘෂ්‍ය, කායික හෝ වෙනත් ගනයට ගැනෙන තර්ජන, බලහත්කාරකම්, ප්‍රචණ්ඩත්වය, බියවැද්දීම්, හෝ එදිරිවාදී ක්‍රියාවන්;

(එ) ඉහත සඳහන් ඕනෑම තත්ත්වයක් සම්බන්ධයෙන් සිදුකරනු ලබන සාවද්‍ය චෝදනා (සාවද්‍ය චෝදනාව සහ පැමිණිල්ලක් ඔප්පු කිරීමට නොහැකි වීම අතර ඇති වෙනස සඳහා 3.7 බලන්න.)

(ඒ) ශ්‍රේණි සාමාර්ථ, පංති සාමාර්ථ, උපාධි ප්‍රදානය, වැඩ පැවරීම්, සහ බඳවාගැනීම් පිළිබඳ තීරණ ගැනීමේදී දඬුවම් පැමිණවීම සහ දඬුවම් පමුණුවන බවට තර්ජනය කිරීම.